Past Papers Wiki



[සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2025
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2025
General Certificate of Education (Adv. Level) Examination, 2025

ඉන්දීය ඉතිහාසය II (II කොටස)
இந்திய வரலாறு II (பகுதி II)
History of India II (Part II)

25 A | S | II

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

- ※ පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- ※ **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- ※ **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ※ **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
  (**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) පුරුෂපුරය | (ii) හින්දුකුෂ් | (iii) මොහෙන්ජොදාරෝ |
| (iv) භාරුකච්ඡ | (v) සත්පුර කඳුවැටිය | (vi) ගෝධාවරී නදිය |
| (vii) කාලිංග | (viii) කනෞජ් | (ix) උජ්ජේනි |
| (x) පාඨලිපුත්‍ර | (xi) සත්ලෙජ් | (xii) බටහිර ඝාට්ස් |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගිනි.)

## B කොටස

2. ඉන්දියානු ඉතිහාසය හැඩගැස්වීමෙහිලා වයඹදිග දූර්ගමාර්ග බලපා ඇති ආකාරය පහත සඳහන් ක්ෂේත්‍ර යටතේ පරීක්ෂා කරන්න.
   (i) ඉන්දියාවට බලපෑ සංක්‍රමණ හා ආක්‍රමණ (ලකුණු 08 යි)
   (ii) ඉන්දියාවෙන් බාහිර ලෝකයට සිදු වූ බලපෑම (ලකුණු 08 යි)

3. ක්‍රි.පූ. 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ පැවති දේශපාලන හා ආගමික තත්ත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

4. "මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීම සිදු වූයේ අශෝක රජුගේ ප්‍රතිපත්තිවලට දැක්වූ බ්‍රාහ්මණ විරෝධය නිසා ය."
   (i) මෞර්ය අධිරාජ්‍යයේ අගනුවර නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) මෞර්ය රාජධානියේ පළමුවන හා දෙවන පාලකයන් පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) අවසාන මෞර්ය පාලකයාගෙන් රජකම පැහැරගත් සේනාපතිගේ නම කුමක් ද? (ලකුණු 01 යි)
   (iv) බ්‍රාහ්මණ විරෝධය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් මෞර්ය අධිරාජ්‍යය බිඳවැටීමට හේතු වූ සාධක සාකච්ඡා කරන්න. (ලකුණු 12 යි)

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (i) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ බිඳවැටීම
   (ii) පශ්චාත් වෛදික යුගයේ සමාජය
   (iii) මෙගස්තිනිස්
   (iv) සංගම් සාහිත්‍යය (ලකුණු 08 × 2 = 16 යි)

[අවසානය පිටුව බලන්න.

## C කොටස

**6.** ඉන්දියාවේ දේශපාලන හා සංස්කෘතික වර්ධනය කෙරෙහි කුෂාණයන්ගේ දායකත්වය විචාරාත්මක ව පරීක්ෂා කරන්න. (ලකුණු 16 යි)

**7.** "දෙවන චන්ද්‍රගුප්ත රජු විසින් ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට පත්කරන ලදී."

(i) දෙවන චන්ද්‍රගුප්ත රජුගේ මව සහ පියා නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දෙවන චන්ද්‍රගුප්ත රජු සමයේ දී ඉන්දියාවට පැමිණි චීන භික්ෂුව නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) ගුප්ත අධිරාජ්‍යයේ උන්නතිය උදෙසා දෙවන චන්ද්‍රගුප්ත රජු පැවැත්වූ විවාහ සම්බන්ධතා පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 03 යි)

(iv) දෙවන චන්ද්‍රගුප්ත රජු ගුප්ත අධිරාජ්‍යය උච්චස්ථානයට ගෙන ආවේ කෙසේ දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10 යි)

**8.** රාජේන්ද්‍ර චෝළ රජු කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් චෝළ පාලකයන්ගේ යුද ජයග්‍රහණ විස්තර කරන්න. (ලකුණු 16 යි)

**9.** පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑ ම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ස්කන්ධගුප්ත රජු

(ii) ත්‍රිකෝණ අරගලය

(iii) පල්ලව කලාව හා ගෘහනිර්මාණ ශිල්පය

(iv) අරාබි සහ තුර්කි ආක්‍රමණ

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න